Lankapastpapers.com

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## කෘෂිකර්ම , පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024 (2026)

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන යටතේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ මෙහි පහත 1වැනි වගන්තියේ සඳහන් 2024.06.30 දිනට පවතින පුරප්පාඩු තනතුරු 125ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

මෙම නිවේදනයේ "ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය" යන්නෙන් අංක 1880/26 දරන හා 2014.09.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා මෙතෙක් එයට සිදුකර ඇති හා ඉදිරියට සිදු කරනු ලැබිය හැකි සියලු සංශෝධන අදහස් වේ. "පත්කිරීම් බලධරයා" යන්නෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද "ලේකම් " යන පදයෙන් "කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් " ද "සේවය" යන්නෙන් " ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය " ද " පත්වීම්" යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ද "ලිඛිත විභාගය " යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024 (2026) ද වෙනත් ආකාරයකින් විස්තර නොවේ නම් "නිලධාරියා" යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරියකු / නිලධාරිනියක ද අදහස් වේ. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2026.10.16 වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2027 ජනවාරි මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

**1. තනතුරු හා පුරප්පාඩු සංඛ්‍යාව**

| *ධාරාව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *තනතුරු කේතය* |
|---|---|---|---|
| කෘෂි සංවර්ධන | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | 75 | 1 |
| කෘෂි පර්යේෂණ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) | 44 | 2 |
| කෘෂි ආර්ථික විද්‍යා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 06 | 3 |

- **අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications- Recruitment/ E.B Exams" ඔස්සේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026.09.21**

**වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර, 2026.10.16 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.**

- නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

- අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

*සටහන :*
සීමිත තරග විභාගයේ දී එක් අයදුම්කරුවකුට අයදුම්කළ හැකි වන්නේ ඉහත එක් ධාරාවක තනතුරකට පමණකි.

**2. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**2.1 ලිඛිත විභාගය :-**

ලිඛිත විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර විෂය නිර්දේශය මෙම නිවේදනයේ පළමු පරිශිෂ්ටයේ දැක්වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 1 ¼ | 100 | 40 |
| විෂයානුබද්ධ අධ්‍යයනය (අදාළ තනතුරට අනුව) | 2 | 100 | 40 |

2.2 ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු ය.

2.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ජ්‍යෙෂ්ඨතාවට ලකුණු ලබාදීම සිදු කෙරේ. විභාගයේ එක් එක් විෂයයන් සඳහා ලකුණු 40% හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

2.3.1 සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨතාව සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය :- අයදුම්කරුවකු නියමිත සුදුසුකම් සපුරාලන දිනයේ සිට අයදුම්පත් භාරගන්නා අවසන් දිනය දක්වා සම්පූර්ණ කර ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය පමණක් ජ්‍යෙෂ්ඨතාව යටතේ ලකුණු ලබා දීම සඳහා ගණන් ගනු ලැබේ. ලකුණු 30 ක උපරිමයකට යටත්ව එම සක්‍රිය හා සතුටුදායක සේවා කාලයට එක් වසරකට ලකුණු 02ක් බැගින් ද, දින 180 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් වෙනුවෙන් ලකුණු 01 බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

2.4 සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨතාව වෙනුවෙන් අයදුම්කරුවන් ලබා ගත් ලකුණු, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් පසු එම ලකුණු සහ ලිඛිත විභාගයේ ලකුණු එකතු කිරීමෙන් එක් එක් තනතුරක් සඳහා වන සීමිත තරග විභාගයේ අවසාන කුසලතා ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දෙනු ඇත. එම ප්‍රමුඛතා ලේඛනයේ කුසලතා අනුපිළිවෙළ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාළ තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ එකඟතාව ලද පසු මෙම විභාගය සඳහා පෙනී සිටි සියලුම අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gove.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

**3. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා කොන්දේසි : -**

3.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

3.2 පත්වීම්ලාභීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

3.3 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් සේවයේ අවශ්‍යතාව අනුව පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් ය. මේ සඳහා නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීමට තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකිය. නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාව අනුව පත් කිරීමේ බලධරයා සහ අදාළ පළාත් බලධරයා අතර ඇති කර ගනු ලබන එකඟතාව අනුව ය.

(අ) සේවයෙන් මුදා හැරීමේ කොන්දේසිවලට යටත්ව, පළාත් රාජ්‍ය සේවයේ තනතුරට පත්වීම් ලිපියක් පළාත් බලධරයා විසින් අදාළ නිලධාරියා වෙත නිකුත් කරනු ඇත. නිලධාරියා අදාළ පළාත් බලධරයා විසින් පළාත තුළ ස්ථාන මාරු කිරීම් කරනු ලැබීමට යටත්වනු ඇත.

(ආ) පළාත් රාජ්‍ය සේවයේ නිරත කාලය තුළ දී වුව ද නිලධාරියකු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට සහ විනය පාලනයට යටත්වනු ඇත.

(ඇ) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහරින ලද කාලය අවසානයේ දී නිලධාරියා නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතු ය.

3.4 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට පත් කිරීමේ දී සීමිත තරග විභාගයෙන් බඳවා ගනු ලබන නිලධාරීන් අවුරුදු 01ක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ. සීමිත බඳවා ගැනීම තුළින් පත් කරනු ලබන නිලධාරීන් වසර 3ක කාලයක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු වේ.

3.5 නිපුණතා සංවර්ධනය :- සේවයට බඳවාගත් නිලධාරීන් සඳහා කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ සමාජ, ආර්ථික, සංස්කෘතික හා රාජකාරි කරන පරිසරයේ ඇති ප්‍රවණතා පිළිබඳ නිපුණතාවක් ලබා ගැනීමට අවශ්‍ය පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හෝ දෙපාර්තමේන්තුව හඳුනා ගන්නා වෙනත් ආයතනයක් විසින් (උදා :- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) මාසයක (01) පුහුණු පාඨමාලාවක් තුළින් ලබා දෙනු ඇත. පාඨමාලාව අවසානයේ කරනු ලබන ඇගයීමකින් පසු සහතිකයක් නිකුත් කරනු ලැබේ. සේවයේ ස්ථිර කිරීමට මෙම සහතිකය ලබා ගත යුතු ය.

3.6 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට ද අංක 2310/29 දරන සහ 2022/12/14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්ය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන) ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින්මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.7 පත්වීම්ලාභීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත කාලය තුළ අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

04. **මාසික වැටුප් පරිමාණය:**

මෙම තනතුරුවලට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව හිමි ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි වේ.

SL – 01–2025 - රු. 82,150 - 2,400×10 – 2,940 ×8 – 3,900 × 17 - රු. 195,970/=
බඳවාගනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට ය.

පත්වීම් ලබන්නන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි 111 උපලේඛනය අනුව වැටුප් ගෙවනු ලැබේ.

05. බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්:

5.1 මූලික සුදුසුකම්

5.1.1 කෘෂි සංවර්ධන ධාරාව සඳහා

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ කෘෂිකර්ම උපදේශක තනතුරක් දරන නිලධාරියකු වීම;

*හෝ*

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ හෝ පළාත් තාක්ෂණ සේවයේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම උපදේශක තනතුරක් දරන නිලධාරියකු වීම;

*හෝ*

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා ඇති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල

කාර්යභාරයන්හි සෘජුවම නියැලී සිටින හෝ නියැලුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නිලධාරියකු වීම;

*හෝ*

(ඇ) වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති උද්‍යාන සහකාර තනතුරක් දරන නිලධාරියකු වීම;

*හෝ*

(ඉ) වසර පහ ( 5 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත කෘෂිකර්ම උපදේශක හෝ උද්‍යාන සහකාර තනතුරක් දරන නිලධාරියකු වීම.

5.1.2. කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා

(අ) වසර පහ ( 05 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආර්ථික විද්‍යාඥ සහකාර තනතුරක් දරන නිලධාරියකු වීම;

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා ඇති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල කාර්යභාරයන් හි සෘජුවම නියැලී සිටින හෝ නියැලුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ නිලධාරියකු වීම.

5.1.3 කෘෂි පර්යේෂණ ධාරාව සඳහා

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හෝ ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියකු වීම;

*හෝ*

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියකු වීම;

*හෝ*

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා ඇති හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල කාර්යභාරයන් හි සෘජුවම නියැලී සිටින හෝ නියැලුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ නිලධාරියකු වීම;

*හෝ*

(ඈ) වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියකු වීම.

***සටහන :***

1. ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ තනතුරු දරන නිලධාරීන් කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා හෝ කෘෂි පර්යේෂණ ධාරාවන් අතුරින් එක් ධාරාවක් යටතේ පමණක් අයදුම් කළ යුතු ය.

2. ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක: 61/ 2006 හි තීරණයට අදාළව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ පෙර ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරන ලද අංක: 1619/ 25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි 2009.11.04 වැනි දිනට කෘෂි මෙහෙයුම් නිලධාරී හෝ වැඩ සටහන් සහකාර (කෘෂිකර්ම) යන තනතුරක් දරන ලදුව, වසර පහ (05) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ කෘෂි මෙහෙයුම් නිලධාරී හෝ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) යන තනතුරක් දරන නිලධාරීන් ද සීමිත බඳවා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. එම නිලධාරීන්ට ද සීමිත බඳවා ගැනීම සඳහා අයදුම් කළ හැකි වන්නේ කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා හෝ කෘෂි පර්යේෂණ යන ධාරාවන් අතුරින් එක් ධාරාවක් යටතේ පමණකි.

5.2. කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

5.3. වෙනත් සුදුසුකම් :-

(i.) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(ii.) සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii.) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට පසුව අයදුම්කරුවකුට අතීතයට බලපැවැත්වෙන පරිදි ලබාදෙනු ලබන සහන හෝ උසස්වීම් විභාගයට පෙනී සිටීම සඳහා නියමිත සුදුසුකම් සපුරාලීමක් සේ සලකා බලනු නොලැබේ.

(iv.) සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

**06. අයදුම්කළ යුතු ක්‍රමය :-**

(*අ*) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දූරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) භාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ආ*) මෙම තනතුරු පහත පරිදි බාණ්ඩගත කරනු ලැබේ:-

| | | |
|---|---|---|
| I | බාණ්ඩය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) |
| II | බාණ්ඩය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) |
| III | බාණ්ඩය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) |

(*ඇ*) විභාග ගාස්තුව රු.1200.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදුකළ යුතු යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මඟින් Any Bank Debit Card with the Facility of Internet Transaction)

III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / “Flex” යෙදවුම මඟින් (Online Banking Method / “ Flex” App of Bank of Ceylon)

IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණ බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ

වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

08. විභාගයට පෙනී සිටීම :-

8.1. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාගයට අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී තමාට හිමි විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. තමාට පෙනී සිටීමට හිමි විභාගයේ නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සෑම අපේක්ෂකයකුගේම වගකීමකි. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

8.2. අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු / ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.3. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව :-

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. විභාග ක්‍රමය :-

10.1. විභාග මාධ්‍යය :-

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.2 අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පමණක් පිළිතුරු ලිවිය යුතු ය.

11. තරග විභාග පටිපාටිය හා අදාළ විෂය නිර්දේශය :-

සියලුම අයදුම්කරුවන් මෙහි පළමු පරිශිෂ්ටයේ දැක්වෙන විෂය නිර්දේශයට අනුකූලව 1 වන හා 2 වන ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතු ය.

එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය පළමු පරිශිෂ්ටයේ දැක්වේ.

12. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අවස්ථාවේ දී ඔවුන් තම අයදුම්පතෙ හි සඳහන් කර ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල මුල් ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු ය.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :-

අපේක්ෂකයකුට මෙම තරග විභාගයට මුහුණ දීම සඳහා සුදුසුකමක් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර ඇති බව හෝ පත්වීම් දිනට පසුව හෙළි වුවහොත් එය ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14. මෙහි විධිවිධාන සලසා නොමැති කිසියම් හෝ කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසන් තීරණය පත්වීම් බලධාරියා විසින් ගනු ඇත.

15. පවතින පුරප්පාඩු සියල්ල හෝ කොටසක් හෝ පිරවීම / නොපිරවීම පිළිබඳ අවසන් තීරණය ගනු ලබනුයේ පත්වීම් බලධාරියා විසින් ය.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයන්හි භාෂා පාඨ අතර යම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

2026 අගෝස්තු මස 31 වැනි දින ,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***රාජ්‍ය සේවා කොමිෂන් සභාව***

*ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024 (2026)*

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

| අයදුම් කරන තනතුර (ගැසට් නිවේදනයේ 1 සහ 5 වන ඡේද බලන්න) | |
|---|---|
| තනතුර | තනතුරු කේතය |
| | |

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(ගැසට් නිවේදනයේ 10 ඡේදය බලන්න - අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුර සඳහා අයදුම්කරන්නේ නම් පිළිතුරු සැපයීමට තෝරාගනු ලබන කොටස: පළමු පරිශිෂ්ටය අනුව (අ) නම් කොටුව තුළ “1” ද, (ආ) නම් කොටුව තුළ “2” ද ලියන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ---------------------------------------------------------------
උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ------------------------------------------------------------------------------------------------

(උදා: GUNAWARDENA, H.M.S.K.)

02. (i) ස්ථිර පදිංචි ලිපිනය: (විභාග ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කෙරේ)

(අ) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ----------------------------------------------------------------------

(ii) රාජකාරි ලිපිනය: (රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියකු නම් ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතු ය. ලිපිනයෙහි වෙනසක් වුණි නම් එය වහාම දැන්විය යුතු ය)

(අ) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ----------------------------------------------------------------------

03. ස්ත්‍රී/පුරුෂභාවය: (ඉදිරි කොටුවෙහි නියමිත අංකය යොදන්න)

පුරුෂ - 0

ස්ත්‍රී - 1

☐

04. ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. ජංගම දුරකථන අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

06. (i) උපන් දිනය: වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස: අවු: ☐☐☐☐ මාස: ☐☐ දින: ☐☐

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යනවග: (නියමිත කොටුවේ කතිර ලකුණ ✓ යොදන්න)

ඔව් ☐ නැත ☐

08. අධ්‍යාපන සුදුසුකම් :

8.1 උපාධි සුදුසුකම් :

| *ලබා ඇති උපාධිය/උපාධි* | *ලබා ඇති උපාධිය/ උපාධි සිව් අවුරුදු උපාධියක් ද/ උපාධි ද යන වග* | *අධ්‍යයන වර්ෂය හා එම උපාධිය/ උපාධි වලංගු වන දිනය (පැහැදිලිව දක්වන්න)* | *විශ්වවිද්‍යාලය/ විද්‍යාල* | *විෂයයන්* | *සාමර්ථ්‍යය* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |

09. මීට පෙර ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීමේ සීමිත තරග විභාගවලට පෙනී සිටියේ ද යන්න ? පෙනී සිටියේ නම් පෙනී සිටි වර්ෂය/වර්ෂයන් සඳහන් කරන්න :- ........................................................................................

10. සීමිත තරග විභාග අපේක්ෂකයින් නිවේදනයේ 5 වැනි ඡේදය යටතේ මෙම විභාගය සඳහා සුදුස්සෙකු වීම පිණිස ලබා ඇති සුදුසුකම් මෙහි පහත දක්වන්න.

| *වර්තමාන තනතුර* | *සීමිත බඳවා ගැනීම යටතේ සුදුසුකම් ලබන තනතුර* | |
|---|---|---|
| 1. *පර්යේෂණ සහකාර*<br>2. *පස් සමීක්ෂක නිලධාරි*<br>3. *ඉඩම් ඇගයීමේ නිලධාරි*<br>4. *කෘෂිකර්ම උපදේශක*<br>5. *ආර්ථික විද්‍යාඥ සහකාර*<br>6. *උද්‍යාන සහකාර*<br>7. *ආශ්‍රිත නිලධාරි සේවා ගණය (තනතුර සඳහන් කරන්න )* | 1. *ස.කෘ.අ. (කෘෂි පර්යේෂණ )*<br>2. *ස.කෘ.අ. (කෘෂි සංවර්ධන)*<br>3. *ස.කෘ.අ. (කෘෂි ආර්ථික විද්‍යා)* | *ස.කෘ.අ. (කෘෂි සංවර්ධන ) ස.කෘ.අ. (කෘෂි පර්යේෂණ ) හෝ ස.කෘ.අ. (කෘෂි ආර්ථික විද්‍යා) තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සම්පූර්ණ කරන දිනය ( ගැසට් නිවේදනයේ 5.1 හි සුදුසුකම් සම්පූර්ණ කරන දිනය )* |

11. ඔබ විසින් ලබාගත් දේශීය/විදේශීය වැටුප් රහිත අධ්‍යයන නිවාඩු හෝ රජයේ වෙනත් සේවාවන්ට මුදාහැර ඇත්නම් හෝ දේශීය / විදේශීය වශයෙන් කිසියම් හෝ වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳව විස්තර සපයන්න
----------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------

12. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වරදකරුව ඇත් ද? ඔව්/නැත
ඔව් නම් විස්තර සපයන්න --------------------------------------------------------------------------

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය:--------------------------------------------------------
(ii) ලදුපත් අංකය හා දිනය:--------------------------------------------------------------------
(iii) ගෙවූ මුදල:----------------------------------------------------------------------------

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.
(ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

14. අයදුම්කරුගේ සහතිකය :-

මෙම අයදුම්පතේ, මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට යටත් බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව දැනගතහොත් මාගේ පත්වීම වහාම අවලංගු වන බවත්, අයදුම්පත සම්පූර්ණ කිරීමේදී යම් ප්‍රමාදයක් සිදුව ඇත්නම් එහි වගකීම මා වෙත පැවරෙන බවත්, මම හොඳාකාරව දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි. තව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් මා ඉදිරිපත් කර ඇත්තේ එක් අයදුම්පතක් පමණක් බවත් ප්‍රකාශ කරමි.

දිනය:------------------------------ ------------------------------------------

අයදුම්කරුගේ අත්සන

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / අමාත්‍යාංශ ලේකම්ගේ සහතිකය :-

........................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ/ අමාත්‍යාංශයේ ....................................... ක ලෙස සේවයේ නියුතු බවත්, ඔහුගේ ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, පූර්වාසන්න වසර 05 ක කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, මෙම තනතුරට අදාළ 5.1 ඡේදයේ සුදුසුකම් සියල්ල සපුරා ඇති බවත්, ඔහු / ඇය මෙම තනතුරට අයදුම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් සපුරන බවත්, ඔහුට / ඇයට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන ඇති / නැති බවත්, සහතික කරමි. ඔහු/ ඇය තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය / නොහැකිය. ( අදාළ නොවන වචන කපා හරින්න. )

---------------------------------------
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /
පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/අමාත්‍යාංශ
ලේකම්ගේ අත්සන.

නම :------------------------------------
තනතුර :------------------------------------
ලිපිනය :--------------------------------------
දිනය :------------------------------------
**(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)**

**පළමු පරිශිෂ්ටය**

**සීමිත තරග විභාග රෙගුලාසි හා විෂය නිර්දේශය**

I වන ප්‍රශ්න පත්‍රය - බුද්ධි පරීක්ෂණය

භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න / කෙටි ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 ¼ කි. මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.

2 වන ප්‍රශ්න පත්‍රය - විෂයානුබද්ධ දැනුම මැන බැලීම

මෙය නියම කර ඇති විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන තනතුරට අදාළ ලිඛිත අභියෝගතා පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවකු විසින් තමන් අයදුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාළ වන පරිදි පහත සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරා ගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට අවකාශ ඇත. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත වේ. කාලය පැය 2 ක් වන අතර, මුළු ලකුණු සංඛ්‍යාව 100 ක් වේ.

***සටහන:-*** පහත සඳහන් විෂය නිර්දේශය අනුව සීමිත විභාගයේදී විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය ක්ෂේත්‍රයේ පළපුරුද්දට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ආකාරයට විභාගය පවත්වනු ලැබේ.

එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය පහත දැක්වේ.

I. කෘෂි පර්යේෂණ ධාරාව සඳහා විෂය නිර්දේශය:

අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතු යි.

**(අ) කොටස**

**01 කෘෂිකාර්මික උද්භිද විද්‍යාව:**

බෝගවල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම.

**02. ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනය:**

මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි **විද්‍යාව ,** විකෘති අනුක ප්‍රවේණිය, සෛල ප්‍රවේණි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගනය සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් පේළි වරණය, බහුලව භාවිත වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

**03. ශාක ව්‍යාධි විද්‍යාව:**

ව්‍යාධි ජනක ජීවී කාණ්ඩ, ආසාදන, ඒවාට පැළෑටි දක්වන සංවේදීතාව, ආසාදන ආකාර හා පාලන මූලධර්ම, ශාක ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණික ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග

විනිශ්චයේ නව තාක්ෂණ ක්‍රම (ELISA) හා වර්තමාන නැඹුරුව.

**04. කීට විද්‍යාවේ මූලධර්ම:**

සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

**05. බීජ තාක්‍ෂණය:**

බීජ කායික විද්‍යාව, බීජයක ව්‍යුහය, සුප්තතාව, ප්‍රරෝහණය, ජීව්‍යතාව, බීජ පරීක්ෂණ සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

**06. පටක විද්‍යාව:**

මූලධර්ම, පටක **විද්‍යාවේ** පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යන්, පටක විද්‍යා රෝපණ ක්‍රම භාවිත කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපණය, විකෘති බිහිවීම, කලල බේරා ගැනීම, නලස්ථ සංසේචනය, ජානයේ පරිණාමය, ප්‍රාක්සංරක්‍ෂණය.

**07. කෘෂිකාර්මික රසායන විද්‍යාව:**

ජීව රසායන විද්‍යාවේ මූලධර්මයන් හා කෘෂිකර්මාන්තයේදී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේදී ප්‍රායෝගික භාවිතයන්

*හෝ*

**(ආ) කොටස**

**01. ශෂ්‍ය විද්‍යාව:**

කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, බෝග වර්ධන මිනුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූලධර්ම, බෝග පාංශු හා ජල සම්බන්ධතාවයේ මූලධර්ම.

**02. බෝග විද්‍යාව:**

වී, උස් බිම් ධාන්‍ය, මාෂ බෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල කායික විද්‍යාව, වර්ධන ප්‍රචාරණ ක්‍රම, රෝපණ ක්‍රම, බෝග පාලනයේ භෞතික, රසායන හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දැව නිෂ්පාදන හා පළතුරු නිෂ්පාදන මූලධර්ම.

**03. පාංශු විද්‍යාව:**

පස නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටලු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂක පාලනය, පැළෑටි පෝෂණය, පැළෑටි වර්ගීකරණ මූලධර්ම.

**04. ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි අභිජනනය:**

මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේණි විද්‍යාව, සෛල ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය

**05. පැළෑටි ව්‍යාධි විද්‍යාව:**

පැළෑටි ආසාදන, ආසාදනවලට පැළෑටිවල සංවේදිතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා

**06. කීට විද්‍යා මූලධර්ම:**

(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උප ඡෙදය යටතේ දක්වා ඇති කොටස මීට අදාළ වේ.

**07.** ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා මූලධර්ම (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යාලේඛන පිළිබඳ දැනුම.

**08. කීට විද්‍යාව:**

කෘෂිකර්මාන්තයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර සහ අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධ හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා පාලනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය.

**09. ක්ෂුද්‍ර ජෛව විද්‍යාව:**

ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂිකර්මාන්තයට ඔවුන්ගේ බලපෑම.

**10. ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානය:**

සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් විශ්ලේෂණ, දත්ත ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

*සටහන:* සීමිත බඳවා ගැනීම් තුළින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුරුවලට අයදුම් කරනු ලබන සියලුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

II. කෘෂි සංවර්ධන ධාරාව සඳහා විෂය නිර්දේශය

**01. සාමාන්‍ය කෘෂිකර්මය:**

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, බෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධ පාලනය, පැළෑටි සංරක්‍ෂණය, උපකරණ, බෝග වගා ක්‍රම, ජලසම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙළීම හා අස්වැන්න නෙළන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපළ නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගා කිරීමට සුදුසු එළවළු වර්ග, පලතුරු, පියලි බෝග සහ ධාන්‍ය තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

**02. බෝග නිෂ්පාදනය:**

ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණික කලාප සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම, බෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, බෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ පාලනය, ජල සම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, බෝග හා ජලය අතර සම්බන්ධතාවේ මූලධර්ම.

**03. ක්ෂේත්‍ර බෝග:**

හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද. පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී බෝගයේ ශෂ්‍ය විද්‍යාව, බෝග පාලනය හා නිෂ්පාදනය, උස් බිම් ධාන්‍ය, රනිල, අල බෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර බෝග (දුම්කොළ, ලූනු, කෙඳි බෝග සහ තෙල් බෝග)

**04. බෝග පාලනය:**

අතුරු බෝග වගාව, අස්වැන්න නෙළීම හා සැකසීම

**05. උද්‍යාන බෝග නිෂ්පාදනය:**

පලතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සාමාජීය හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

**06. පලතුරු, එළවළු හා මල් නිෂ්පාදනය:**

තවාන් පාලනය, උද්‍යාන පාලනය, බෝග ආශ්‍රිත නව තාක්ෂණ හා වගා ක්‍රම, පලතුරු හා එළවළු බෝග වැඩි දියුණු කිරීම, පලතුරු හා එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පලතුරු හා එළවළුවල පසු අස්වනු හානි වළකා ගැනීම, ජෛව තාක්ෂණය, පලතුරු හා එළවළුවලට දේශීය හා විදේශීය වෙළඳපොළ, නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවන්, එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරණ තාක්ෂණය, වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති, භූමි අලංකරණ මූලධර්ම.

**07. කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුව:**

කෘෂිකර්ම ව්‍යාප්තිය අර්ථ දැක්වීම හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අනුවර්තනය හා නව්‍යතා විසරණය, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශ, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, සමාලෝචන ඇගයීම, ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ ක්‍රියාවලිය, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිත කෙරෙන විවිධ ක්‍රම, පාඩම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

**08. බීජ තාක්‍ෂණය:**

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ප්‍රරෝහණ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහණ ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

**09. මී මැසි පාලනය:**

මී මැසි ගණාවාසයක මී මැසි වර්ග හා වද වර්ග, මී මැසි පෙට්ටිවල කොටස්, මී මැසි ගණාවාස අල්ලා ගැනීම, තැන්පත් කිරීම, කට්ටි බෙදීම, මී මැසි ගණාවාසයක රෝග හා පළිබෝධ.

### III. කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා විෂය නිර්දේශය

**01. කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපළ පාලනය:**

කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපළ පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍රත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවදානම පිළිබඳ මූලධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිචාපක, කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානයට මුහුණදීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැම්යාව හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික මිල නියම කිරීමට අදාළ වන පරිදි මිල න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපළ ප්‍රමාණය හා පරිමාණානුකූල ඵල, පවුල් ගොවිපළ වැදගත්කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපළ යාන්ත්‍රීකරණයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේ දී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

**02. කෘෂිකාර්මික අලෙවිය:**

අලෙවි කිරීමේ මූලධර්ම, නිෂ්පාදනයේ හා අලෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අලෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහිලා එවැනි ආයතනයක කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අලෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූලධර්ම.

**03. ඉඩම් ආර්ථික විද්‍යාව:**

ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩසටහනේ වැදගත්කම.

09 - 164

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.